# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2018

## අනුමාන ප්‍රශ්න පත්‍රය - 02

**සිංහල - i** සැකසුම: දර්ශනපති ගිහාන් හෙට්ටිආරච්චි **පැය තුනයි**

- පළමු වැනි ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදන්න.

1 කොටස

(01) පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) ....... යනු හෙයින් සතර මහ මුහුද පැන් විතරවත් බොහෝ ව යනාදීන් අනමතග්ගපරියාය සූත්‍රය වදාරත් වදාරත් මුවාත් තබන යකඩෙක මලකඩ ඉගිළෙන්නා සේ ශෝක දුඃඛය තුනී විය. ශෝක දුඃඛය තුනී නියාව දැන ලා බුදුහු පටාචාරාවන් බණවාලා 'හෙම්බා පටාචාරාවෙනි, දෙමව්පිය ආදීහු මිය පරලොව යන්නවුන්ට තුමූ ජීවත් ව හිඳත් පිහිට විය නොහෙති. නුවණැත්තවුන් විසින් **ශීලවිශුද්ධිය** කොට ගෙන තම තමන්ට පිහිට විය යුතු ය'යි වදාරා විසි වන මග්ගවග කෙළවර ගාථා දෙකකින් බණ වදාළ සේක. දේශනා කෙළවර පටාචාරාවෝ පොළොව පස් විතරටත් බොහෝ කෙලෙසුන් ගෙවා සෝවාන් වීමෙන් ආර්‍ය ජාතියෙහි පිහිටා ජාතීන් ශුද්ධ කළහ. සංසාර දෝශය නිසා ඇති නුගුණත් හළහ. නටුවා වූ **ලොවී සැපතට** ලොවුතුරා සැපතුත් යම්තම් විතරක් ලත්හ. සෙසුත් බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

(i) තමා ජීවත් ව සිටිය ද කළ නොහැක්කේ කමක් ද?

(ii) මේ තැනැත්තිය ශෝක දුඃඛයට පත් වන්නේ ඇයි?

(iii) ලෝකෝත්තර සැපත යම්තම් ලැබූ බව ප්‍රකාශ වන්නේ ඇයි දැයි පහදන්න.

(iv) **ශීලවිශුද්ධිය, ලොවී සැපතට** යන පදවලට අර්ථ සපයන්න.

(ආ) මෙසේ ඔහු දෙදෙන ගම් බිම් ගෙවා වලට වැද නිසි තැනක් බලා ඇවිදිනාහු පලු පල්ලවලඞ්කෘත **ස්නිග්ධච්ඡායා** සම්පන්න සුවිමලපුලිනතලයෙන් රම්‍ය භූමි ප්‍රදේශයෙක්හි පන්සල් කොට වාසය කළාහ. එකල්හි රාජකන්‍යා ද ඔහු පන්සලින් බැහැර නොයවා මිහිරි ඵලාඵල ගෙනවුත් දී උපස්ථාන කරන්නී උදාසනක් සේ නැගී සිට පන්සල ඇමද උණු පැන් සිහිල් පැන් ආදිය ද දැහැටි දඬු ආදිය ද පිළියෙල කොට තබා වල්ලභයා නැගී සිටි කල්හි මූණ සෝදවා නොයෙක් ඖෂධ ජාතීන් එක් කොට අඹරා තබා බෙහෙත් දියෙන් නාවා ආලේප කොට මධුර ඵලාඵල ගෙනවුත් දී උපස්ථාන කරන්නී උදාසනක් සේ කළමනා වතාවත් කොට ස්වාමීනි කළමනා අත් පා මෙහෙවර මම කෙරෙමි. නුඹ වහන්සේ කනස්සලු නූව මැනැවැයි කියා පසඟ පිහිටුවා වැඳ ඵලාඵල ගෙනෙන පැස ද අල උදුරන උල ද අතු නමාගන්නා දෙවිල්ල ද අරගෙන වලට ගොස් මිහිරි ඵලාඵලයෙන් පැස පුරා ඇරගෙන අවුත් පන්සල එක් තැනක තබා කළය ගෙන පැන් පුරා ගෙනවුත් නොයෙක් බෙහෙත් සුනු බෙහෙත් පැනින් ඒ රජහු නාවා මධුර ඵලාඵල කවා සුවඳ පැන් පොවා දඬුමැස්සේ කොළ අතුට මොළොක් කොට ඔහු සැතපුණු කල්හි පය සෝදා මැඩ කළමනා උපස්ථාන කොට පසු ව තුමූ ඵලවැල කා එම **සව්‍යාපාර්ශ්වයෙහි** සැතපෙන්නී ය.

(i) මේ දෙදෙන වනයකට පිවිසියේ ඇයි?

(ii) බිරිඳ සැමියාට දෛනික ව සිදු කළ උපස්ථාන මොනවා ද?

(iii) රාජ කන්‍යාව සිය සැමියා සුපවත් කර ගත්තේ කෙසේ ද?.

(iv) **ස්නිග්ධච්ඡායා, සව්‍යපාර්ශ්වයෙහි** යන පදවලට අර්ථ සපයන්න.

(ඉ) තව ද තොපගේ අතිරක්ත වූ අධරයුග්මයෙහි රශ්මීන් රැඳුනා වූ දන්ත පන්තීහු විලිකුන් දෙළුම් බිජු පෙළක් මෙන් බබළන්නාහ. තව ද අනංගයාගේ මාලිගාදොර නොහොත් රති මැදිරි දොර **රන් රටෙක** බඳනා ලද නිල් ධ්වජ දෙකක් හා සමාන වූ තොපගේ බැම සඟළ කාමී පුරුෂයන් තමා කරා කැඳවන්නාක් මෙන් විශේෂයෙන් බබළයි. තව ද මොනර පිල් කලබක් මෙන් දික් ව **අක් බබුරු** වූ තොපගේ කසමල් රැසක් වැනි නිල් වූ කෙස් වැටිය සිසාරා පලඳනා ලද ඉද්දමල්දමින් ඉතා සිත්කලු ය. සොඳුර! තෙපි කිනම් ද? තොපගේ දෙමවුපියෝ කිනම්හු ද? තෙපි තාම සස්වාමික කෙනෙකු ද? නොහොත් අස්වාමික කෙනෙකු ද? ඒ හැම මට නොවළහා කියව'යි කීහ. එසේ හෙයින් කියන ලදි.

(i) මෙම වර්ණනයට ලක්වන්නියගේ නම හා ඇය විසූ ස්ථානය කුමක් ද?

(ii) ඇගේ බැම සඟල සමාන කරන්නේ කුමකට ද?

(iii) මේ තැනැත්තියගේ දසන්වල පැහැයත් ඊට හේතුවත් දක්වන්න.

(iv) **රන් රටෙක, අක් බබුරු** යන පදවල අර්ථ ලියන්න

(ඊ) ගැඹුරු **විජම් පෙළ කිරි සයුර ඇම විට**

**සොඳුරු නුවණ මෙර පහරින් සකොබ කොට**

**මියුරු පද අරුත් අම ගෙන දෙන ලොවට**

**කවුරු සදිසි වෙති මෙකලට එයතිඳුට**

**විහිගුම් නොයෙක් දිටු සකිලිටු ගිම් විහිට**

**දෙන තුම් සගපවග පල සිරි මුළු ලොවට**

**නරදම් සැරි සුතුරු දම් තුගු සුර තුරට**

**මනරම් ඔහු නුවණ දෙරණම විය පිහිට**

i. මෙම කවි දෙකෙහි ඇතුළත් රූපකාලංකාර සියල්ල ලියන්න

ii. මෙහි වර්ණනා කෙරෙන්නේ කවුරුන් පිළිබඳ ව ද?

iii. වර්ණිත පුද්ගලයාගේ නුවණ කෙබඳු ද?

iv. **විජම් පෙළ, නරදම් සැරි** යන පදවල අර්ථ පැහැදිලි කරන්න.

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) 'එසේ වී නම් වෙහෙර දොරටුව කෙරේ ලවා පියව'

(ii) 'එසේ වී නම් තෝ කන් යොමා සකස් කොට අසව'

(iii) 'එසේ හෙයින් තොප විසින් කළමනා කටයුත්තෙහි අප්‍රමාද වව'

(iv) 'එයා දන්නවා, ඒත් නොදන්නව වගේ ඉන්නව'

(v) ‘අර ලී කොටයක් වගේ පා වෙන්නේ කිඹුල තමයි’

(vi) ‘ඔබ මෙය පැලඳ ගන්න, මම එය බලල සැනසෙන්නම්’

(ඉ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

අලියා වැටුණු වැව සිටි හේරත් හා මි
මා වැනියකු වුව ද මම වැදගත් වී මි
මිනී කපන මුත් ඒ හේරත් හා මි
ඔහු මට වඩා විසි තිස් ගුණයෙන් දැ මි

ඉස්පිරිතාලයේ අලියා වැටුණු වැ වේ
මළ මූ ඇදීමෙන් ඔහුගේ දවස ගෙ වේ
මාසික පඩිය ලැබ පෙන්නූ නමුදු සු වේ
ඔහු දුටු සෑම විට මා දුක්මුසු ව තැ වේ

ඇඟපත දැඩිය හැඩ ඇති හීන් දැ රිය
වයසක් නොමැති නාඹර ඉලන්දා රිය
කිසියෙක් තවම නැත පැවසුමට බා රිය
මට පුදුමයකි ඔහු මේ කරන කා රිය

මා වැනියකුට තද සංවේගය ම දි දී
හැමදා උදේ ඔහු මගෙ වැසිකිළිය අ දී
හදිසියෙ යමකු මළහොත් දොස්තර ද වි දී
අප ඉදිරියේ ඔහු මළ කුණ කපන ල දී

ගොවි-කම්කරු රදළ උඩරට කිසි ම කු ලේ
වෙන කිසි කෙනෙකු තව නැත මේ වැඩය ක ලේ
දැනගන්නට කිසිදු වරදක් නොමැති මො ලේ
කිසි අනතුරක් නොකරයි කිසිවෙකුට කැ ලේ

අවනත සිනා රැලි වත නිතර ම පතු රයි
හැම වදනක් ම අවිහිංසකව ම පතු රයි
හැමදා වගේ සවසට බොන ගිනි වතු රයි
ඔහුගේ පපුව දැඩි කරුණාවෙන් උතු රයි

පිහියා පහර ලැබ ඔහුගේ නැගණි අ නේ
මළ හැටි සිහි ව මගෙ නෙත තෙත ගතිය දැ නේ
නැඩුව නමුත් ඔහු නැගණිය මැරුණු දි නේ
උණ ගත් දාට වැලපෙයි නෙත කඳුළු පෙ නේ

නැගණිය මළ විට දි දොස්තර සමග ගො සින්
ඇගෙ කය කපන ලදි හේරත් හාමි වි සින්
බැන්නත් ඔහුට මේ ගැන ගම නරක බ සින්
ඔහු හට වැඩක් නැත ලොව ඇති රුහිරු ම සින්

නූපන් නිසා දනවත් මහරු පාය ක
පන්සල වෙතට යයි හැම විට ම පෝය ක
අලුතෙන් හැදුව වෙහෙරට ඔහු ද දාය ක
ඊටත් වඩා සලකයි අයියනාය ක

(02) යුගයට සාපේක්ෂ ව මනුෂ්‍යයා කෙරෙහි විප්ලවීය දෘෂ්ටියක් හෙළීම සද්ධර්මරත්නාවලි කතා කලාවේ සුවිශේෂත්වයකි. නිදසුන් තුනක්වත් දෙමින් උක්ත ප්‍රකාශය ගැන ඔබේ අදහස් දක්වන්න.

නැතහොත්

තත්කාලීන දේශපාලන හා සමාජ දේහයේ උද්ගත ව පැවති සිදුවීම් නිරූපණය කරන කෘතියක් වශයෙන් ජාතක පොත අගය කළ හැකිදැයි නියමිත කතා දෙකක් ඇසුරු කරමින් පැහැදිලි කරන්න.

(03) කුසලාකුසල විනිශ්චය මතු නොව දේශීය සමාජය හා සංස්කෘතිය අධ්‍යයනය කිරීමේ මූලාශ්‍රයයක් වශයෙන් ද සද්ධර්මාලංකාරය ඇගයිය හැකි බව නියමිත කතා දෙක ඇසුරින් සනිදර්ශන ව විමසන්න.

(04) තම අදහස් තහවුරු කිරීම සඳහා බෞද්ධ හා හින්දු සාහිත්‍යාගත තොරතුරු ඉදිරිපත් කිරීමට ගිරා සන්දේශ රචකයා කෙතෙක් දුරට සමත් ව ඇත්දැයි අභිමත වැනුම් තුනකින් වත් නිදසුන් දෙමින් විමසන්න.

(05) මළගිය ඇත්තෝ නවකතාවේ විස්තර වන්නේ විවිධ ජීවන දුෂ්කරතා හා බාධක ජය ගත නොහැකි ව අපේක්ෂා භංගත්වයට පත් වන පුද්ගලයන්ගේ චරිත ස්වභාවය බව සනිදර්ශන ව විමසන්න.

(06) මාපිය - දූදරු සම්බන්ධතාවල ස්වභාවය ඉස්මතු කිරීමට නූතන කෙටිකතාකරුවන් ප්‍රයත්න දරා ඇති ආකාරය අභිමත කෙටිකතා දෙකක් වත් ඇසුරු කරමින් උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

(07) විචිත්‍රවත් සංකල්ප රූප යොදා ගැනීමත් ඉලක්කගත එක් ප්‍රස්තුතයක් ඉක්මවා පුළුල් සමාජ වපසරියක් ආවරණය වන සේ කාව්‍යකරණයේ යෙදීමත් නිසා නූතන පද්‍ය සහෘදයාට වඩාත් සමීප වී ඇත. නියමිත පද්‍ය පන්තිවලින් නිර්මාණ තුනක් වත් යොදා ගෙන මේ ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(08) නාට්‍යෝචිත අවස්ථා හා කුතුහල රස සපිරි නිර්මාණයක් වීම නිසා රත්නාවලිය ප්‍රේක්ෂකයාගේ අමන්දානන්දයට හේතු වේ. නිදසුන් දෙමින් මේ අදහස පහදන්න.